**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජනවාරි 2019

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

මෙවර ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ප්‍රමාණික මට්ටමින් සාර්ථකව උත්තර සපයා ඇති බව දක්නට ලැබුනි. එසේ වුවද සමස්ථයක් ලෙස ගත්කළ සමහර ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබු උත්තරවල යම් යම් අඩුපාඩුකම් තිබු බව පැහැදිලිය. ඒ පිළිබඳව උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරික්ෂණයන් පහත දැක්වේ:

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

සමස්තයක් ලෙස විෂය නිර්දේශයෙහි පුළුල් පරාසයක් ආවරණය වන පරිදි මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% ක් සඳහා මෙම කොටස සකස් වී තිබුණි. මුලික ආර්ථික විද්‍යාත්මක න්‍යායන් හා සංකල්ප පදනම් කරගනිමින් විෂය නිර්දේශයෙහි බරතැබිම්වලට ගැලපෙන අයුරින් මෙය සැකසී තිබුණි. ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා දෙන ලද වරණයන් අතුරින් නිවැරදි වරණයන් තේරීමටත්, ප්‍රශ්න **1.11** සිට **1.15** දක්වා යම් න්‍යායාත්මක ප්‍රකාශයක් දී එහි සත්‍ය හෝ අසත්‍ය බව දැක්වීමටත්, ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා දෙන ලද පිළිතුරු 02 ක් අතුරින් නිවැරදි පිළිතුර සොයා හිස්තැන පිරවීමටත් යන සරල ආකෘතියක් යටතේ මෙම ප්‍රශ්නය සකස්කර තිබුණි.

මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සපයා සාධනිය මට්ටමකට ලකුණු ලබා තිබු බව කිව යුතුව ඇත. කෙසේවෙතත් මෙම කොටසේ සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ උත්තරවල අඩුපාඩු නිරික්ෂණය විය.

<u>අයදුම්කරුවන් සැපයු පිළිතුරු අනුව පොදුවේ දක්නට ලැබුණු වැරදි / දූර්වලතා කිහිපයක් පහත දැක්වේ:</u>

**1.1** ආර්ථික විද්‍යාවේ හිඟකම යන්න නිවැරදිව දැක්වෙන ප්‍රකාශය වන (4) වන ප්‍රකාශය, එනම් මානව අවශ්‍යතා සහ අසීමිත මානව වුවමනා වලට අදාළව සම්පත් වල පවත්නා සීමිත බව යන පිළිතුර අයදුම්කරුවන් සියලු දෙනාම නිවැරදිව සපයා ලකුණු 2 ලබාගත් බව පෙනුනි.

**1.2** x සහ y භාණ්ඩ අතර හරස් ඉල්ලුම් නම්‍යතාවය ධන වන්නේ නම් එම භාණ්ඩ, "ආදේශක භාණ්ඩ" යන්න සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි පිළිතුර ලෙස සපයා තිබුණි.

**1.3** පූර්ණ තරගයේ ලක්ෂණ සම්බන්ධයෙන් දී ඇති පිළිතුරු 4 ම නිවැරදි බව බොහෝ අයදුම්කරුවන් පිළිතුරු ලෙස සපයා ලකුණු ලබාගෙන තිබුණි. අයදුම්කරුවන්ගෙන් සුළු ප්‍රමාණයක් 2 වන පිළිතුර ලෙස පිළිතුර සපයා තිබුණි.

**1.4** ආයතනයක ලාභය උපරීම වන්නේ (4) වන පිළිතුර වන "ආන්තික පිරිවැය ආන්තික ආදායමට සමාන වන විටය" යන නිවැරදි පිළිතුරු සැපයුවේ අයදුම්කරුවන්ගෙන් සුළු කොටසක් වන අතර වැරදි පිළිතුරු සැපයු අයදුම්කරුවන් බොහෝ වේ.

**1.5** සාපේක්ෂ වශයෙන් අනම්‍ය ඉල්ලුමක් තිබෙන භාණ්ඩයක් මත බදදක් පැනවීමෙන් බදු බරෙන් විශාල කොටසක් පාරිභෝගිකයන් විසින් දරනු ලබන බව බොහෝ අයදුම්කරුවන් ලියා නොතිබුණි. ඔවුන් 4 වන වරණය නිවැරදි ලෙස ලියා ලකුණු ලබා ගැනිමට අපොහොසත් වි ඇත.

**1.6** රජයේ සාර්ව ආර්ථික අරමුණු මොනවාද යන්නට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර ලෙස (3) වන වරණය දැක්වීමට අපොහොසත් වි තිබුණ. ඔවුන්ට ඒ ගැන මනා වැටහීමක් නොමැති බව දක්නට ලැබුණි.

**1.7** වෙළෙඳපොල ආර්ථිකයේ නිවැරදි ලක්ෂණ ලෙස 4 වෙනි වරණය නිවැරදිව තෝරාගත් අයදුම්කරුවන් බොහෝ වේ. එබැවින් බහුතරය ලකුණු ලබාගැනීමට සමත් වි ඇත.

**1.8** සාමාන්‍ය මුළු පිරිවැය අවම ලක්ෂයේදී සාමාන්‍ය මුළු පිරිවැය ආන්තික පිරිවැයට සමාන වන බව බොහෝ සිසුන් හඳුනාගෙන තිබුණි.

**1.9** ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ පුද්ගල ආදායම නිවැරදිව දැක්වීමට අපොහොසත් වි ඇත. අයදුම්කරුවන් විසින් මහ බැංකු වාර්තා වැනි වාර්ෂික වාර්තා භාවිතා කිරිමට නොකර ඇති බව පෙනේ.

**1.10** ගෙවුම් ශේෂ ලේඛනයේ වෙළෙඳ ගිණුමේ ධනාත්මක ශේෂයන් පෙන්නුම් කරන ආකාරය 1 වන වරණය ලෙස බොහෝ අයදුම්කරුවන් නිවැරදිව තෝරා ලකුණු ලබාගෙන තිබුණි.

**1.11 - 1.15** දක්වා දෙන ලද ප්‍රකාශයන්හි සත්‍ය/ අසත්‍ය බව සටහන් කිරිම තුළින් නිවැරදි පිළිතුර තෝරාගත යුතුය. සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්න 5 ට උත්තර සැපයිම අසාර්ථක මට්ටමක පැවතිනි. එම ප්‍රශ්න අතුරෙන් අයදුම්කරුවන් වැඩිපුරම වැරදි උත්තර දී තිබුණේ 1 ප්‍රශ්නයටය. උපේක්ෂා වක්‍රය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම හා අවබෝධය පිළිබඳ විමසා බලා තිබුණි. අනවබෝධය නිසා පිළිතුරු වැරදි ලෙස සපයා තිබුණි.

1.16 - 1.20 දක්වා දෙන ලද ප්‍රශ්නවලට දී ඇති පිළිතුර දෙකෙන් නිවැරදි පිළිතුර තෝරාගත යුතුය. වැඩි දෙනෙක් වැරදි උත්තර සපයා තිබුණේ 1.20 ප්‍රශ්නයටයි.

මුල්‍ය අතරමැදිකරණය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ප්‍රමාණවත් නොවන බව වැරදි පිළිතුරු සැපයීමෙන් අවබෝධ විය. බොහෝදෙනෙකුට ලකුණු ලබා ගැනිමට නොහැකි වු ප්‍රශ්නය මෙයයි.

## B කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

### ප්‍රශ්න අංක 02 - ලකුණු 10

**(a)** පාරිභෝගික හැසිරිම විශ්ලේෂණය කිරිම තුලින් ඉල්ලුම් හා සැපයුම් වක්‍ර මගින් සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කිරිම මෙයින් බලාපොරොත්තු වු අතර බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණත් සමහර අයදුම්කරුවන්ට දි ඇති සමිකරණය නිවැරදිව සුළු කර ගැනීමට නොහැකි වි තිබුණි.

මෙහි තුන්වන කොටසට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත්වි තිබුණි. පාරිභෝගික රුචිය බැහැරවිම යන කොටස අයදුම්කරුවන්ට තේරුම් ගත නොහැකි තත්වයකට පත්වි තිබිණ. එමනිසා බොහෝ අය ඉල්ලුමේ ඇතිවන අඩුවිම හෝ වැඩිවිම ලෙස තේරුම් ගෙන තිබිණ. ඉල්ලුම අඩුවිම සහ සමතුලිත මිල අඩුවිම යන්න නිවැරදිව ලියු අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකි.

**(b)** මිල ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරනු ලබන සාධක පිළිබඳව අවබෝධය පරික්ෂා කිරිමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණත්, ඔවුන් ඉදිරිපත් කර තිබුණු පිළිතුරු ප්‍රශ්නයට නොගැලපෙන අයුරින් ඉදිරිපත් කර තිබුණි.

## ප්‍රශ්න අංක **03** - ලකුණු 10

**(a)** මෙම ප්‍රශ්නය, ආර්ථික විද්‍යාවේ නිෂ්පාදනය හා පිරිවැය යන සංකල්පයන් යටතේ ගොඩනැගුනු ප්‍රශ්ණයකි. ආයතනයක් වසාදමන ලක්ෂය හා සමච්ජේදන ලක්ෂය අතර වෙනස ප්‍රස්ථාරයක් ආධාරයෙන් නිවැරදිව පැහැදිලි කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වූ බව පිළිතුරු වලින් ඔප්පුවේ. වසා දැමීමේ මිල ගැන අයදුම්කරුවන්ට කිසිම අවබෝධයක් නොමැති බවත් ආයතනයේ සමච්ඡේද ලක්ෂයේදී මුළු ආදායම, මුළු පිරිවැයට සමාන වීමට අවශ්‍ය බව ඔවුන් නොදැන සිටි බැවින් නිවැරදිව ප්‍රස්ථාරය ඇඳ නිවැරදිව පැහැදිලි කිරම් කිරීමට අපොහොසත් වූ බව කිව හැක.

**(b)** **(i)** වාණිජ බැංකුවක කාර්යයන් තුන ලිවීමෙන් ලකුණු 3 ලබාගත් අයදුම්කරුවන් බොහෝ සිටියත්, සමහර අයදුම්කරුවන් විසින් මුදල් නිකුත් කිරීම, භාණ්ඩාගාර බිල්පත් හා සුරැකුම්පත් අලෙවිකරන බවත්, ආර්ථිකයට වඩාත් වාසිදායක සේවයක් ඉටුකරන බවත් සඳහන් කර තිබුණි.

**(ii)** ශ්‍රී ලංකාවේ බලපත්‍ර ලාභී වාණිජ බැංකු ලෙස ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශිය සංවර්ධන බැංකුව සියලුම අයදුම්කරුවන් වාගේ පිළිතුර ලෙස ලියා තිබුණි. ඔවුන්ට වාණිජ බැංකු පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බව සෑම පිළිතුරක්ම පරික්ෂා කිරීමෙන් අවබෝධ විය.

## ප්‍රශ්න අංක **04** - ලකුණු 10

**(a)** මුදල් හා මිල මට්ටම යන සංකල්පය යටතේ මුදලට ඇති ඉල්ලුම පිළිබඳව දැනුම සහ අවබෝධය පරික්ෂා කිරීමට මෙම ප්‍රශ්නය අසා තිබූ අතර, නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් වූ බව ප්‍රශ්නයක් බව පෙනේ. ප්‍රස්ථාරය නිවැරදිව ඇඳීමට අයදුම්කරුවන්ට අවබෝධයක් නොතිබුණි.

සමතුලිත පොලී අනුපාතය ගැන ඔවුන් කිසිම අධ්‍යයනයක යෙදී නොතිබුණ බව පිළිතුරු වලින් පැහැදිලි විය. සමහර අයදුම්කරුවන් ඉල්ලුම් වක්‍ර වෙනුවට සැපයුම් වක්‍ර ඇඳ තිබුණ බවත් එවැනි අයදුම්කරුවන්ට ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැති බව පිළිතුරු වලින් මනාව පැහැදිලි විය. මෙය ඉතාමත්ම දුර්වල ලෙස පිළිතුරු සැපයූ ප්‍රශ්නයකි.

**(b)** උද්ධමනය හා මිල මට්ටම යන සංකල්පය යටතේ අයදුම්කරුවන්ගේ කාලීන දැනුම පරික්ෂා කිරීමට මෙම ප්‍රශ්නය අසා ඇත. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පැහැදිලි කර තිබුණි. පිරිවැයෙන් තල්ලුවූන උද්ධමනය පිළිබඳ නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් වීම නිසා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

## ප්‍රශ්න අංක **05** - ලකුණු 10

**(a)** මූල්‍ය ප්‍රතිපත්තිය හා එහි උපකරණ යන සංකල්පය යටතේ අයදුම්කරුවන්ගේ දැනුම පරික්ෂා කිරීමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත.

මුදල් සැපයුම කළමනාකරණය කිරීමේදී විවට / විවෘත වෙළඳ කටයුතු ප්‍රමාණාත්මක පාලනයක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේද යන්නට අයදුම්කරුවන් බොහෝමයක් නිවැරදි අදහස එන අයුරින් පිළිතුර ඉදිරිපත් කර නොතිබුණි. එයට හේතුව ප්‍රශ්නය තේරුම් ගැනීමට අපොහොසත් වීම විය යුතුය. සමහර අයදුම්කරුවන් "විවෘත වෙළඳපළ" යනුවෙන් වෙනත් වෙළඳපලවල් පිළිබඳව ලියූ පිළිතුරු ද විය. මහ බැංකුවේ කටයුත්තක් යන්න ගැන අවබෝධයක් ඔවුන්ට නොතිබිණි. එහෙත් සමහර අයදුම්කරුවන්ට භාණ්ඩාගාර බිල්පත් විකිණීම සහ මිලදීගැනීම පිළිබඳව නිවැරදි අවබෝධයක් නොතිබිණි. නිවැරදි පිළිතුර ලියූ ස්වල්ප අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණක් සිටියහ.

**(b)** ආරක්ෂණවාදයේ අවාසි 2 ක් යන්න අන්තර් ජාතික වෙළඳාම සම්බන්ධ සංකල්පයක් යටතේ අසා තිබු ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ලියා ලකුණු දෙක ලබාගත් අයදුම්කරුවන් බොහෝ වේ.

**(c)** රුපියල අවප්‍රමාණ වීම පිළිබඳව ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු ලියා ලකුණු 4 ලබාගත් අයදුම්කරුවන් බොහෝ විය. නමුත් සමහර අයදුම්කරුවන් අවප්‍රමාණවීම යන්න වැරදියට වටහාගෙන ඒ වෙනුවට රුපියලේ අගය වැඩිවීම පිළිබඳව ලියා තිබුණි.

## C කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**

**(A)** **(a)** වෙළඳපොල ක්‍රමය තුළ රජයේ කාර්යභාරය යන සංකල්පය යටතේ අයදුම්කවරුන්ගේ ප්‍රායෝගික දැනුම පරික්ෂා කිරීමට දි ඇති ප්‍රශ්නයක් බව පෙනේ. රාජ්‍ය ව්‍යවසායයන්හි අවාසි දෙකක් සඳහන් කරන ලෙස ඉදිරිපත් කර ඇති අතර බොහෝ අයදුම්කරුවන්ට ලකුණු 02 ක් ලෙහෙසියෙන්ම ලබාගත හැකි වු ප්‍රශ්නයකි.

**(b)** රාජ්‍ය අයවැයේ ප්‍රධාන අරමුණු 04 ක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතය. ආදායම් වියදම් පිළිබඳව දැක්වීමේදී වියදම්, රජයේ වැටුප් ආදිය පිළිබඳව නොවැදගත් කරුණු ඉදිරිපත් කර තිබුණි.

**(B)** "ජාතික ගිණුම්වලට" අදාළ ප්‍රායෝගික අවබෝධය පරික්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට සම්පුර්ණ ලකුණු ලබාගත් අයදුම්කරුවන් සිටියේ අවම ප්‍රමාණයකි.

**(a)** මුලික මිල අනුව දළ (සමස්ත) එකතු කළ අගය සෙවීමට බොහෝ අයදුම්කරුවන් අසාර්ථක ප්‍රයත්නයක් දරා තිබුණි. ඊට ප්‍රධාන හේතුවක් වි තිබුණේ දළ එකතු කළ අගය නිවැරදිව ගණනය කිරීමට නොදැන සිටිමය. ඔවුන් සේවක ආදායම් එකතු කර ඊට ශුද්ධ වක්‍ර බදුද එකතු කර තිබු අතර, සමහර අයදුම්කරුවන් විදේශිය ශුද්ධ වර්තන සංක්‍රාම ද එකතු කර වැරදි පිළිතුරු ඉදිරිපත් කිරීම නිසා සම්පුර්ණ ලකුණු ලබාගැනිමට අපොහොසත් වි තිබිණි.

**(b)** වෙළඳපොල මිලට දළ දේශිය නිෂ්පාදිතය සෙවිමේදී ද සම්පුර්ණ ලකුණු ලබාගැනිමට නොහැකි වුයේ ඉහත (a) කොටසේ පිළිතුර අසාර්ථක විමත්, ඊට එකතු කළ යුතු ශුද්ධ වක්‍රබදු වෙනුවට, නිෂ්පාදන සහ ආනයන මත වන, ශුද්ධ බදු එකතු කිරීම නිසාය.

**(c)** දළ ජාතික ආදායම සෙවිමේදී සමහර අයදුම්කරුවන් නිවැරදිව විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම වන රු. මිලියන 1,200 එකතු කර එහි ලකුණ ලබාගත්තත් පෙර ගණනය කිරීම් නිවැරදි නොවූ නිසා සම්පුර්ණ ලකුණු ලබාගැනිමට අපොහොසත් වි තිබිණි.

**(d)** වැයකළ හැකි දළ ජාතික ආදායම ලබාගැනිමට ඉහතින් ලබාගත් පිළිතුරු වලට ශුද්ධ වර්තන සංක්‍රාම එකතු කිරීම වෙනුවට ශුද්ධ වක්‍ර බදු එකතු කර ඇති නිසා ඔවුන්ට පහසුවෙන් ලාබගත හැකි ලකුණු 10 ලබාගැනිමට අපොහොසත් වි තිබුණි.

මේ අනුව මෙම ගණනය කිරීම සඳහා යොදාගන්නා සමිකරණ පිළිබඳව ඔවුන්ට අවබෝධයක් නොමැති බවත් පිළිතුරුපත් පරික්ෂා කිරීමේදී ඔප්පු වුන කරුණකි. ජාතික ගිණුම්කරණය පිළිබඳ සම්පුර්ණ අවබෝධයක් අයදුම්කරුවන්ට නොමැති බව දී තිබූ උත්තරවලින් මනාව පැහැදිලි විය.

**(C)** **(a)** ආර්ථික වර්ධනය පිළිබඳවද සමහර අයදුම්කරුවන් සැපයූ පිළිතුරු ඉතා අසාර්ථකය. ආර්ථික වර්ධනය යන්නට සංවර්ධනය විස්තර කෙරෙන කරුණු ලියා තිබීම ද දක්නට ලැබුණි.

**(b)** ආර්ථික සංවර්ධනයට සමහර අයදුම්කරුවන් ලියා තිබූ පිළිතුරු ප්‍රමාණවත් නොවුනත්, සමහර අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු ලියා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත්වී ඇත. ආර්ථික සංවර්ධනය යටතේ ආර්ථික වර්ධනය පිළිබඳව කරුණු දක්වා තිබීම ද දක්නට ලැබුණි.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

4. මෙම විෂයට අදාල ස්ව-අධ්‍යයන පාඩම්මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -